# සමූහ නිෂ්පාදනය ගොවිතැන නංවන අත්හදා බැලීමක්

### සමූහ නිෂ්පාදනය අළුත්ම දෙයක්ද?

සමූහ නිෂ්පාදනය ශ්‍රී ලංකාවේ ගොවිතැන් කටයුතුවල දී අළුත් ම අදහසක් හැටියට ඉදිරිපත් කරන්න පුළුවන්කමක් නැහැ. දේශීය සංස්කෘතිය ගැන කල්පනා කරන කොට ඈත අතීතයේ සිට ම විශේෂයෙන් ගැමි ජනතාව තම තමන් ගේ ජීවිතයේ අවශ්‍යතාවයන් සපුරාගැනීමේ දී සමූහයක් වශයෙන් කටයුතු කිරීමෙන් ලැබෙන මහගු ප්‍රතිඵල වටහා ගෙන තිබුණු බවට සාක්ෂි තිබෙනවා. ගොවිතැන් කටයුතුවල දී, විශේෂයෙන් කුඹුරු ගොවිතැනෙහි දී යායක වැඩ කරන ගොවීන් සමූහයක් වශයෙන් බෙදී යායෙහි කට්ටි කට්ටි වශයෙන් වැඩ කිරීම පුරාණයේ සිට පැවත ආ සිරිතක් බව ඔප්පුවන සාක්ෂි බොහෝ තිබෙනවා. මෑතක් වනතුරු ම ගැමි සංස්කෘතියෙහි දක්නට ලැබුණු 'අත්තම්' හා 'බෙත්ම' වැනි සමූහ ක්‍රියා මාර්ගයන් අනුව අපට හිතන්නට ඉඩ තිබෙන්නේ සමූහ නිෂ්පාදන කටයුතු අපේ ගොවි ජනතාවට අළුත් දෙයක් නොවන බව යි.

කෙසේ වුවත්, නොයෙකුත් හැල හැප්පීම් වලට භාජනය වූ සංස්කෘතියේ ඇතැම් අංග නොයෙකුත් ආකාරයෙන් වෙනස් උනා. සමූහයක් වශයෙන් පොදු අරමුණක් කරා යොමු වීමේ වටිනාකම පිළිබඳව තිබුණු හැඟීම ඉවත් වී ක්‍රමයෙන් පෞද්ගලිකත්වය කෙරේ වැඩි සැලකිල්ලක් දැක්වීමේ සිරිතට අපි පුරුදු උනා. ගොවිතැන් කටයුතුවල දී මේ තත්වය විශේෂ කොට සඳහන් කරන්නට පුළුවනි. තමන්ගේම ය කියන කුඹුරක් හෝ ගොඩ ඉඩමක් වටා වැට කඩුළු බැඳ ගෙන අසල්වැසි සහෝදර ගොවි ජනතාව ගේ ගොවිතැන් කටයුතු පිළිබඳව වැඩි සැලකිල්ලක් නොදක්වා තමන් ගේ වැඩ තමන් ම බලා ගැනීමේ පුරුද්දට අපි ක්‍රමයෙන් ඇබ්බැහි උනා. මේ තත්වය ඇත්ත වශයෙන් ම ගොවිතැන් කටයුතුවල දී අසතුටුදයක තත්වයක් බව ඔප්පු වී තිබෙනවා. කුඹුරු යායක් ගොවිතැන් කරන අය එක්වරම පොදු වැඩ සටහනක් අනුව ගොවිතැන් නොකිරීමත්, තම තමන් ගේ හිතු මනාපයේ හැටියට පොර හා බිත්තර වී වර්ග යනාදිය යෙදීමත් හේතු කොට ගෙන වී ගොවිතැන කෘමී වසන්ගත ආදියට ගොදුරු වීමේ අවදානම වැඩි උනා පමණක් නොව, අස්වැන්න ද අඩු උනා.

### ආයතන අත්හදා බැලීම්

ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, බැම්බිවත්තේ කෘෂිකාර්මික පලදා වර්ධන කමිටු ප්‍රදේශයේ ගොවිතැන් කටයුතු පිළිබඳව නොයෙකුත් අත්හදා බැලීම් කර ගෙන යනවා. මෙම ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානයේ දී සාමාන්‍යයෙන් වී ගොවිතැන් කටයුතු දියුණු කිරීම සඳහා සමූහ නිෂ්පාදනය පදනම් කර ගත් වැඩ පිළිවෙළක් අත්හදා බැලීමක් වශයෙන් ක්‍රියාත්මක කළා. 1975/76 මහ කන්නයේ දී මෙම ප්‍රදේශයේ අක්කර 16 ක පමණ වපසරියක් වැඩ කරන ගොවීන් 18 දෙනෙක් තෝරා ගෙන සමූහයක් වශයෙන් ගොවිතැන් කටයුතු කිරීමට ආයතනයේ දේශීය කාර්ය මණ්ඩලයත්, විදේශීය විශේෂඥයනුත් වැඩ පිළිවෙළක් සකස් කළා. මෙම වැඩ පිළිවෙල යටතේ මේ ගොවීන් 18 දෙනාට ම එකම අවස්ථාවක එකම වර්ගයේ බිත්තර වී ලබා දී, පොර යෙදීම, වල් පැල ඉවත් කිරීම, කෘමී නාශක යෙදීම යනාදී කටයුතු එක්වරම සිදු කිරීමට ප්‍රදේශයේ පලදා වර්ධන කමිටුවේ සහයෝගය ඇතිව කටයුතු සැලසුවා. මෙම ව්‍යායාමයෙන් ලැබුණු ප්‍රතිඵල විශිෂ්ට නොවුවත්, සෑහෙන අයුරින් සතුටුදයක යයි කියන්නට පුළුවනි. 1974/75 මහ කන්නයේ දී පෞද්ගලික පදනමක් මත මෙම කුඹුරු ඉඩම් වැඩ කළ ගොවියෙකුට සාමාන්‍යයෙන් ලබා ගැනීමට පුළුවන් උනේ අක්කරයකට බුසල් 32 ක අස්වැන්නක්. කෙසේ වෙතත් සමූහ නිෂ්පාදන වැඩ පිළිවෙළ යටතේ මෙය

බුසල් 65 ක් පමණ තෙක් වැඩි වූ බව හෙළි දරව් උනා. මෙම සාර්ථක ප්‍රතිඵල වලින් ධෛර්යට පත් ආයතනය අක්කර 300 ක් පමණ වැඩ කරන ගොවීන් 300 ක් දෙන සහභාගි කරවා ගෙන 1975/76 යල කන්නයේ දී සමූහ වී නිෂ්පාදන කණ්ඩායම් 15 ක් සංවිධානය කළා. අවාසනාවකට මෙන් දීර්ඝ කාලයක් තිස්සේ පැවති නියගය නිසා මෙම වැඩ පිළිවෙළට බාධා පැමිණුනා. ස්ථිරව ජලය ලබා ගත හැකි වූ කුඹුරු වලින්, ගොවීන් බලාපොරොත්තු වූ ප්‍රමාණයට වැඩි අස්වැන්නක් ලබා ගැනීමට පුළුවන් වී තිබුණා.

## ගැටළු ගැන අදහස් හුවමාරුවක්

මීට අමතරව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය විසින් පර්යේෂණ මධ්‍යස්ථාන ප්‍රදේශයේ තරුණයින් ද සහභාගි කරවා ගෙන සමූහ නිෂ්පාදනය පදනම් කර ගත් ගොඩ ගොවිතැන් වැඩ පිළිවෙළක් හා කුකුළන් ඇති කිරීමේ වැඩ පිළිවෙළක් ද දැන් ක්‍රියාත්මක කර තිබෙනවා. මෙයින් අදහස් කරන්නේ වැඩි අස්වැන්නක් ලබා ගැනීමේ පොදු අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා පෞද්ගලිකත්වය යටපත් කර පොදුවේ වැඩ කිරීමට ගොවි ජනතාව පෙළඹ වීමයි. දැනට ලබා ඇති අත්දැකීම් වල ප්‍රතිඵල ගැන සලකා බලන කළ කිව හැක්කේ ඇත්ත වශයෙන් ම ගොවිතැන් කටයුතු දියුණුවට සමූහ නිෂ්පාදනය නව මාර්ගයක් වන බව යි. මෙම වැඩ පිළිවෙළට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවත්, ග්‍රාමීය ආයතන හා පලද වර්ධන නීති අංශයත්, හුඟක් දුරට උදව් වුනා.

මෙම ප්‍රයත්නයෙන් ලැබුණු අත්දැකීම්වල ප්‍රතිඵල පිළිබඳව අවබෝධයක් අනෙකුත් ප්‍රදේශවල සහෝදර ගොවීන් වෙත ලබා දී ඒ ප්‍රදේශවල ද පුළුල් වශයෙන් මෙවැනි වැඩ පිළිවෙලක් දියත් කිරීමේ පරමාර්ථය අරබයා 1976 සැප්තැම්බර් මස 20 වැනි දින ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී 'සමූහ නිෂ්පාදන ගැටළු හා මතු බලාපොරොත්තු' යන මැයෙන් සමුළුවක් පැවැත්වුනා. බැම්මිණිවත්තේ සමූහ නිෂ්පාදන අත්හද බැලීමට සහභාගි වූ ගොවි ජනතාවත්, මෙම වැඩ පිළිවෙළ නුදුරු අනාගතයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන මහනුවර, කුරුණෑගල හා අනුරාධපුරය යන දිස්ත්‍රික්කවලින් තෝරා ගත් පලද වර්ධන කමිටුවල සභාපතිවරුනුත් මේ සම්මන්ත්‍රණයට සහභාගි වී අළුත් වැඩ පිළිවෙළ ගැන ඔවුන් ගේ අදහස් ප්‍රකාශ කළා. ගොවි කටයුතු දියුණු කිරීමට ඇප කැප වී සිටින නොයෙකුත් අය සමුළුවේ දී පහත සඳහන් විදියට අදහස් දැක් වූවා.

''ගොවීන් ගේ ඉඩම් අයිතිය පිළිබඳ කිසිදු වෙනසක් නොකර වැඩි පලදායිතාවයක් ලබා ගැනීම සඳහා අරමුණු කෙරෙන එක් ක්‍රමයකි සමූහ නිෂ්පාදනය. සමූහ නිෂ්පාදන ක්‍රමය කින් තම තමන් ගේ නිෂ්පාදන ක්‍රමය වැඩි කර ගැනීමට ගොවීන්ට හැකි වෙතැයි බලාපොරොත්තු වනු ලැබේ.''–**කෘෂිකර්ම හා ඉඩම් ඇමති හෙක්ටර් කොබ්බෑකඩුව මහතා.**

''පෞද්ගලික කුඩා බිම් කට්ටි ගොවිතැන් කරන ගොවීන් මුහුණ දෙන ඇතැම් ගැටළු මඟහරවා ගැනීමටත්, ගොවිතැන් කටයුතු වඩාත් පුළුල් අන්දමින් කර ගෙන යාමේ වාසි අවබෝධ කර ගැනීමටත්, සමූහ නිෂ්පාදන ක්‍රමය උපකාරී වන්නේ ය'' – **ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ සී. නාරායනසාමි මහතා.**

''ගොවි කටයුතු රටාව තුළ ඉදිරිපත් කර ඇති පලද වර්ධන පණත, ඉඩම් ප්‍රතිසංස්කරණ පණත, කෘෂිකාර්මික රක්ෂණ පණත වැනි නව නීති රීති ක්‍රියාත්මක කිරීම සඳහා උව මනා කරන වාතාවරණය සමූහ නිෂ්පාදන ක්‍රමයක් මගින් ඇති කර ගැනීමට පුළුවනි.'' **ග්‍රාමීය ආයතන හා පලද වර්ධන නීති අංශයේ අධ්‍යක්ෂ අයි. කේ. වීරවර්ධන මහතා.**

''සමූහ නිෂ්පාදන ක්‍රමය යටතේ ගොවි මහත්වරුන්ට පෞද්ගලිකව සිය වගා කටයුතු කළ හැකි වන අතර, අලෙවිය, යන්ත්‍රෝපකරණ භාවිතය ආදී අනෙකුත් කටයුතු සහෝදර ගොවි ජනතාව සමඟ බෙදා හදා ගෙන කිරීමට පුළුවන් වන්නේ ය'' **ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ, ප්‍රධාන උපදේශක, ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ, එජ්. ජී. සෝන්ඩර්ස් මහතා**

මෙම සම්මන්ත්‍රණයට සහභාගි වූ ගොවි මහත්වරුනුත්, පලද වර්ධන කමිටු සභාපති වරුනුත්, සමූහ වී නිෂ්පාදනය, සමූහ සත්ව පාලනය, සමූහ ගොඩ ගොවිතැන හා කළ මණාකාරිත්වය හා ආයතන යන විෂයයන් යටතේ කණ්ඩායම් හතරකට බෙදී මෙවැනි ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ දීමට සිදු වන ගැටළුත්, ඒ පිළිබඳ මතු බලා පොරොත්තුත් ගැන තම අදහස් ඉදිරිපත් කළා. එම අදහස්වලින් පහත සඳහන් ඒවා ඉතාමත් වැදගත් හැටියට සඳහන් කරන්නට පුළුවනි.

## වී ගොවිතැන

- ප්‍රදේශයක සමූහ නිෂ්පාදන වැඩ පිළිවෙළක් සැලසුම් කර ක්‍රියාත්මක කිරීමේ දී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ග්‍රාමීය ආයතන හා පලද වර්ධන නීති අංශය, ලංකා බැංකුව, කෘෂි කාර්මික රක්ෂණ මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව වැනි ක්ෂේත්‍ර කටයුතු හා අදාල දෙපාර්තමේන්තුවලින් සම්පූර්ණ සහයෝගය ලබා ගත යුතු වේ.
- එක කණ්ඩායමකට විසි දෙනෙකුට වැඩියෙන් අයත් වූවොත් පාලනය කිරීමේ කටයුතු දුෂ්කර වන නිසා කණ්ඩායමේ සාමාජික සංඛ්‍යාව හැකිතාක් දුරට අඩු වෙන් තබා ගැනීම ගැන සැලකිලිමත් විය යුතු ය.
- කණ්ඩායමේ කෙනෙකුට ම නායකත්වය පැවරිය යුතු ය.
- කණ්ඩායමේ ගොවිතැන් කටයුතුවලට අවශ්‍ය වන යෙදවුම් පලද වර්ධන කමිටුව විසින් සපයා දිය යුතු වේ.
- මෙම කණ්ඩායම සිය අයවැය තබා ගැනීම සඳහා සැලකිල්ලක් දක්විය යුතු අතර, ඒ පිළිබඳව පුහුණුවක්ද, ඔවුනට ලබා දීම අවශ්‍යය.
- කණ්ඩායම් වශයෙන් ගොවිතැන් කටයුතු කරතත්, ඉඩම් භුක්ති ක්‍රමයෙහි වෙනසක් සිදු නොවිය යුතු ය.

## සත්ව පාලනය

- කිරි පට්ටි සංවිධානය සඳහා ලෝක බැංකුවෙන් දෙන ආධාර සමූහ සත්ව පාලන කටයුතු සඳහා ද, පුළුල් කළයුතුය.
- සමූහ සත්ව පාලන කටයුතු ආරම්භ කර ඇති කණ්ඩායම්වලට ඇතැම් කොන් දේසිවලට යටත්ව ණය සහන සපයා දිය යුතු යි.
- හරක් මඩු ඉදි කිරීම, සත්ව ආහාර ප්‍රවාහණය කිරීම, ණය ලබා ගැනීම, අලෙවිය ආදී කටයුතු සමූහ පදනමක් මත ඉටු කළයුතු ය.
- සමූහ සත්ව පාලන කටයුතු සඳහා උවමනා කරන ඉඩම් රජය විසින් ලබා දීමට උනන්දු විය යුතු ය.
- මෙවැනි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමේදී, ඕනෑ කරන වේලාවට පශු වෛද්‍ය සේවාවන් සපයාදීම, ඉතාමත් වැදගත් වේ.
- සමූහ සත්ව පාලන වැඩ පිළිවෙළට සම්බන්ධ අයට අවශ්‍ය පුහුණුව ලබා දීම ව්‍යාප්ති සේවය භාර ගත යුතු වගකීමකි.

## ගොඩ ගොවිතැන

- සමූහ නිෂ්පාදනය පදනම් කර ගෙන ගොඩ ගොවිතැන් කරන අවස්ථාවක යටත්පිරිසෙයින් එම සමූහයේ එක් සාමාජිකයෙක්වත් ගොවි කාරක සභාවේ සාමාජිකයෙක් විය යුතු ය.
- සමූහ ගොඩ ගොවිතැන් සඳහා ණයදීමේ දී එය ගොවි කාරක සභාවේ සභාපති තුමාගේත් නිර්දේශය අනුව විය යුතු ය.
- සමූහයේ සාමාජිකයින්ට ගොවි අය වැය පිළිබඳ පුහුණුවක් ලබා දීම අවශ්‍යය.
- සමූහයක් විසින් නිෂ්පාදනය කරන ද්‍රව්‍ය සඳහා ඔවුනට සාධාරණ මිළක් ලැබේ ද

යන්න ගැන වගකීම කෘෂි කාර්මික පලදා වර්ධන කමිටුව භාර ගත යුතුය.

❁ ණය දීමේ දී දැනට පවතින දැඩි නීති රීතිවලින් සමන්විත ක්‍රියා පරිපාටිය සමූහ නිෂ්පාදන කටයුතු සම්බන්ධයෙන් ලිහිල් කිරීම ද වැදගත් ය.

**කළමනාකාරිත්වය හා ආයතන**

❁ ගොවි කාරක සභාවල සාමාජිකත්වය යටත්පිරිසෙයින් 50% ක් තරුණයින් හා කාන්තාවන් ගෙන් සමන්විත විය යුතුය.

❁ සියළු ම ගොවි ආරවුල් ගොවි කාරක සභා මට්ටමින් විසඳා ගැනීමට වැඩ පිළි වෙළක් යෙදිය යුතුය.

❁ සමූහයකට දෙනු ලබන සියළු ම ණය එකම ආයතනයකින් ලබා ගැනීමට පුළුවන් වීම ද වැදගත් වේ.

❁ ගොවි කාරක සභා ඉඩම් පරිහරණ රටාව පදනම් කර ගෙන පත් කළ යුතු ය.

❁ සියළු ම ව්‍යාප්ති සේවාවන් එකම වහලක් යටතේ ලබා ගැනීමට සැලැස්වීම සමූහ නිෂ්පාදන ක්‍රියාවලිය දිරිගැන්වීමට දෙන උදව්වකි.

❁ සමූහ නිෂ්පාදන වැඩ කටයුතුවල ප්‍රගතිය පාලනය කිරීම සඳහා ප්‍රදේශයේ උප දිසාපති, ප්‍රාදේශීය නිලධාරී, කෘෂිකර්ම උපදේශක හා ගොවි කාරක සභාවේ, පලදා වර්ධන කමිටුවේ සාමාජිකයින් ගෙන් සමන්විත ප්‍රගති පාලන කමිටුවක් සැලසුම් කළයුතුය.

මෙවැනි වැදගත් කරුණු මෙම සම්මන්ත්‍රණයෙන් ඉස්මතු වූන අතර, නුදුරු අනාගතයේදී සමූහ නිෂ්පාදනක්‍රම ක්‍රියාත්මක කෙරෙන දිස්ත්‍රික්කවල ගැටළු මගහරවා ගැනීම සඳහා මෙම කරුණු බෙහෙවින් උපකාරී වනු ඇත.

# ශ්‍රී ලංකා අගමැතිනිට ජාත්‍යන්තර උපහාර

ආහාර හා කෘෂිකර්ම සංවිධානය වාර්ෂිකව පිරිනමන උපහාර පදක්කම මෙවර අපේ අගමැතිනියට පිරිනමා ඇත. කොළඹ නොබැඳි ජාතීන්ගේ සමුළුව ආරම්භ වූ පසුගිය අගෝස්තු 16 ද රෝමයේ දී මුල්වරට නිකුත් කළ මෙම පදක්කමේ එක් පැත්තක වී කරල් මිටියක් අතින් ගත් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ රූපයක් වේ. අනිත් පැත්තේ 'සාමය හා සැමට ආහාර – කොළඹ' යන වදන් සඳහන් වෙනවා.

බණ්ඩාරනායක මැතිනිය ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ සැලසුම්වලට උද්යෝගීමත් සහයෝගය දෙන, කාන්තාවගේ අභිවෘද්ධිය සඳහා මහත් සේවාවක් කළ කාන්තාවක් ලෙස එම සංවිධානය මගින් හඳුන්වා දී තිබෙනවා. සංවර්ධනය වන රටවල් ස්වයංපෝෂිත කිරීමට නම් ජාත්‍යන්තර පෝර අරමුදලක් ඇති කළ යුතු බවට අප අගමැතිනිය කලකට ඉහත දී කළ යෝජනාව අනුවයි, එම සංවිධානයේ ජාත්‍යන්තර පෝර සැලැස්ම සකස් කර තිබෙන්නේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අනුබද්ධිත ආයතනයක් වන ආහාර හා කෘෂිකර්ම සංවිධානය මිනිස් සංහතියේ අභිවෘද්ධිය සඳහා ඉමහත් සේවාවක් කරන පුද්ගලයන්ට මෙම උපහාර පදක්කම වාර්ෂිකව පිරිනමනවා.